## ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2016

---

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ (432 අධිකාරියේ) 5 සහ 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 අහිතකර මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 අහිතකර මතය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) වයඹ, දකුණ, නැගෙනහිර, උතුරු මැද, ඌව හා උතුර යන පළාත්වලට අදාල දායක මුදල් අරමුදලට බැර වී නොතිබූ අතර ඒවා ලැබිය යුතු දායක මුදල් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මුදල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවනු ලබන අතර, එකී වියදම හඳුනාගෙන අරමුදලේ ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පිරිවෙන් හා උපකෘත පාසල්වල ගුරුවරුන්ගෙන් විශ්‍රාම වැටුප් දායක අරමුදලට මූලික වැටුපෙන් සියයට 6 ක් සහ ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට මූලික වැටුපෙන් සියයට 6 ක් වශයෙන් සියයට 12 ක් වූ රු.58,842,224 ක මුදල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව ගුරු වැන්දඹු අනත්දරු අරමුදලේ දායක මුදල් ලැබීම තුල ගුරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා අයකරන ලද රු. 29,421,112 ක් වූ මුදලද ඇතුලත්ව තිබීමෙන් දායක මුදල් ලැබීම් රු.29,421,112 කින් වැඩියෙන් සටහන් වී තිබුණි.

#### 2.2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1953 අංක 44 දරන පාථශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) | නියෝගය ප්‍රකාර එක් එක් ආධාර මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයන් පවත්වා නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පිඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.1 (අ) ඡේදය | වාර්ෂික අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.102,956,197 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 89,644,498 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 13,311,699 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ආපසු ගෙවීම් රු. 1,173,160 කින් එනම් සියයට 32 කින් පහළ යාම සහ පොළී ආදායම රු. 2,671,525 කින් එනම් සියයට 06 කින් හා දායක මුදල් ලැබීම් රු. 11,069,425 කින් එනම් සියයට 22 කින් ඉහළ යාම, අතිරික්තයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. කෙසේ වුවද 2.2.1 ඡේදයේ සඳහන් ගිණුම්කරණ අඩුපාඩු මතද මෙම මූල්‍ය ප්‍රතිඵලය වෙනස් විය හැකිව තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

1953 අංක 44 දරණ පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල් මඟින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතු වුවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් උක්ත වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණ කෙරේ.

(අ) අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය තුළ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව සහ සාමාජිකයින්ගේ නම, පාසල ඇතුලත් උපලේඛනයන් නඩත්තු නොකිරීම නිසා අරමුදලට ලැබිය යුතු මුදල, ලද මුදල හා හිඟ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ආ) දායක මුදල් ගෙවීම් ක්‍රමවේදයේ කාර්යසාධනය ඇගයීමට හැකි පරිදි එම අංශයට ඒ ඒ මාසයේ දායක මුදල් ආපසු ගැනීමට ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව ගෙවූ හා අත ඉතිරි අයදුම්පත්‍ර සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පවත්වා ගෙන නොතිබුණි.

(ඇ) දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය චර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කළද, එම මුදල් නිවැරදිව අරමුදල සඳහා ලැබුනේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධානතම මෙහෙයුම් කාර්ය වන ගුරු වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් වියදම, අයවැය ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

(ආ) අරමුදලේ දායක මුදල් ලැබීම්, දායක මුදල් ආපසු ගෙවීම් හා ආයෝජන මත බදු ගෙවීම යන අයිතම්වල අයවැයගත අගය හා තත්‍ය අගය අතර, පිළිවෙලින් සියයට 35, සියයට 67, සියයට 59 ක විචලතාවයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

### 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබු අතරම සාමාජිකයන්ගේ කේවල ගිණුම් පවත්වා නොතිබීම නිසා ගිණුම්කරන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.